ආයතනයේ නම - රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව.

**පළාත් පාලන ආයතනයේ දැක්ම**: ඌව පළාතේ මුල් තැනට අභිමානයෙන්.

**පළාත් පාලන ආයතනයේ මෙහෙවර**: රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාබල ප්‍රදේශය තුල වෙසෙන ජනතාවගේ ආර්ථික සමාජීය හා සංස්කෘතික සංවර්ධනයක් උදෙසා භෞතික හා මානව සම්පත් කාර්යක්ෂමව හා ඵලදායි ලෙස යොදාගනිමින් ජනතා සහභාගීත්වයක් තුලින් මිත්‍රශීලී සේවාවක් සැපයීම රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාවේ මෙහෙවරයි.

පළාත් පාලන ආයතන සඳහා පුරවැසි ප්‍රඥප්තිය

| අ.අ | 2<br>ලබාදෙන දසේවාව | 3<br>ඉදිරිපත් කළ යුතු ලියකියවිල | 4<br>සැළුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය | 5<br>වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | 6<br>කාර්ය නිම කිරීමට ගත වන අවම කාලය | 7<br>අදාළ ගාස්තුව |
|---|---|---|---|---|---|---|
| 01 | ගොඩනැගිලි සැලසුම් සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීම | 1.නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය<br>2. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම් පත්‍රයේ සහතික කරන ලද පිටපතක්<br>3. සුදුසුකම් ලත් තැනැත්තකු විසින් සහතික කරන ලද ගොඩනැගිලි සැලැස්මේ පිටපත් 04 (ඉදිකිරීමේ ස්වභාවය අනුව අදාළ වන සුදුසුකම් ලත් තැනැත්තාකවුද යන්න සභාවේ වෙබ් අඩවියෙන් හෝ පෙරටු කාර්යාලයෙන් දැන ගැනීමට හැකි ය)<br>4. ගොඩනැගිල්ල ඉදි කරනු ලබන ඉඩමේ අනුමත මිනින්දෝරු සැලැස්මේ පිටපතක්<br>5. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ස්වභාවය අනුව ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති ආයතනවලින් නිකුත් කරනු ලබන සහතික<br>6.ඉල්ලුම්කරු ඉඩම් හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩම් හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය<br>7. ඉඩම පිහිටි ස්ථානයට පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා අවට පිහිටීම ද පෙන්නුම් කරන පරිදි අඳින ලද දළ රූප සටහනක්<br>8.නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ඉඩමේ ඔප්පුවේ පිටපතක්<br>9. වරිපනම් අය කරන ප්‍රදේශයක පිහිටි ඉඩමක් වන විට, ඉඩමේ හිමිකරුගේ නමින් දේපල ලියාපදිංචි කර තිබිය යුතු ය | 01.පෙරටු කාර්යාල නිලධාරී<br>: 055-2256614 | 01.තාක්ෂණ නිලධාරී-055-22566142. විෂය භාර නිලධාරී - 055-2256614 | දින 21 | 1. ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු. 375.00 -නේවාසික<br>රු.500.00 -වානිජ |

| අ.අ. | 2<br>ලබාදෙන සේවාව | 3<br>ඉදිරිපත් කළ යුතු ලියකියවිල | 4<br>සැළුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය | 5<br>වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | 6<br>කාර්ය නිම කිරීමට ගත වන අවම කාලය | 7<br>අදාළ ගාස්තුව |
|---|---|---|---|---|---|---|

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 02 | ඉඩම් අනු බෙදුම් හා ඒකාබද්ධ කිරීමේ සංවර්ධන සැලසුම් අනුමැතිය | 1. නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය<br>2. ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම් පත්‍රයේ සහතික කරන ලද පිටපතක්<br>3. සුදුසුකම් ලත් තැනැත්තකු විසින් සහතික කරන ලද ඉඩම අනු බෙදුමට හෝ ඉඩම් ඒකාබද්ධ කිරීමට අදාළ මිනින්දෝරු සැලැස්මේ පිටපත් 3 ක් (සංවර්ධනයේ ස්වභාවය අනුව අදාළ වන සුදුසුකම් ලත් තැනැත්තා කවරෙක් ද යන්න සභාවේ වෙබ් අඩවියෙන් හෝ පෙරටු කාර්යාලයෙන් දැන ගැනීමට හැකි ය)<br>4. සංවර්ධනයේ ස්වභාවය අනුව ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති ආයතනවලින් නිකුත් කරනු ලබන සහතික<br>5. ඉල්ලුම්කරු ඉඩම් හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩම් හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය<br>6. නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ඉඩමේ ඔප්පුවේ පිටපතක්<br>7. ඉඩම පිහිටි ස්ථානයට පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා අවට පිහිටීම ද පෙන්නුම් කරන පරිදි අඳින ලද දළ රූප සටහනක්<br>8. වරිපනම් අය කරන ප්‍රදේශයක පිහිටි ඉඩමක් වන විට, ඉඩමේ හිමිකරුගේ නමින් දේපළ ලියාපදිංචි කර තිබිය යුතු ය | 01.පෙරටු කාර්යාල නිලධාරී 055-2256614 | 01.තාක්ෂණ නිලධාරී- 055-2256614<br>2. විෂය භාර නිලධාරී - 055-2256614 | දින 07 | 1. ඉල්ලුම්පත්‍ර ගාස්තුව රු.100.00 |
| 03 | අනුකූලතා සහතිකය නිකුත් කිරීම | 1. නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය<br>2. නිකුත් කළ සංවර්ධන බලපත්‍රයේ සහ අනුමත සැලසුයම් පිටපතක් බැගින්. | 01.පෙරටු කාර්යාල නිලධාරී 055-2256614 | 01.තාක්ෂණ නිලධාරී- 055-2256614<br>විෂය භාර නිලධාරී 055-2256614 | දින 03 | 1. ඉල්ලුම් පත්‍ර ගාස්තුව නැත |

| පළාත් පාලන ආයතන සඳහා පුරවැසි ප්‍රඥප්තිය | | | | | | |
|---|---|---|---|---|---|---|
| අ.අ. | 2<br>ලබාදෙන සේවාව | 3<br>ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | 4<br>සෘජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය | 5<br>වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | 6<br>කාර්යය නිම කිරීමට ගත වන අවම කාලය | 7<br>අදාළ ගාස්තුව |
| 04 | අනවසර ඉදිකිරීම් සඳහා ආවරණ අනුමතිය | 1.නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය<br>2. ඉල්ලුම්කරුගේ ජාතික හඳුනුම් පත්‍රයේ සහතික කරන ලද පිටපතක්<br>3. සුදුසුකම් ලත් තාක්ෂණිකයකු විසින් සහතික කරන ලද ගොඩනැගිලි සැලැස්මේ පිටපත් 04 (ඉදිකිරීමේ ස්වභාවය අනුව අදාළ වන සුදුසුකම් ලත් තාක්ෂණිකයා කවුද යන්න සභාවේ වෙබ් අඩවියෙන් හෝ පෙරටු කාර්යාලයෙන් දැන ගැනීමට හැකි ය)<br>4. ගොඩනැගිල්ල ඉදි කරනු ලබන ඉඩමේ අනුමත මිනින්දෝරු සැලැස්මේ පිටපතක්<br>5. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ස්වභාවය අනුව ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති ආයතනවලින් නිකුත් කරනු ලබන සහතික<br>6.ඉල්ලුම්කරු ඉඩම් හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩම් හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය<br>7. ඉඩම පිහිටි ස්ථානයට පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා අවට පිහිටීම ද පෙන්නුම් කරන පරිදි අඳින ලද දළ රූප සටහනක්<br>8.නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ඉඩමේ ඔප්පුවේ පිටපතක්<br>9. වරිපනම් අය කරන ප්‍රදේශයක පිහිටි ඉඩමක් වන විට, ඉඩමේ හිමිකරුගේ නමින් දේපල ලියාපදිංචි කර තිබිය යුතු ය | 01.පෙරටු කාර්යාල නිලධාරී 055-2256614 | 01.තාක්ෂණ නිලධාරී- 055-2256614<br>2. විෂය භාර නිලධාරී - 055-2256614 | දින 14 | 1. ඉල්ලුම් පත්‍ර ගාස්තුව නැත |
| 05 | වීථිරේඛා /ගොඩනැගිලි සීමා සහතික නිකුත් කිරීම | 1. නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය<br>2. ඉඩමට අදාළ මිනින්දෝරු සැලැස්යම් පිටපතක්<br>3.ඉල්ලුම්කරුයේ ජාතික හඳුනුම් පත්‍රයේ සහතික කළ පිටපතක්<br>4. ඉල්ලුම්කරු ඉඩයම් හිමිකරු යනාවන අවස්ථාවක දී ඉඩම් හිමිකරුයේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය | 01.පෙරටු කාර්යාල නිලධාරී 055-2256614 | 01.තාක්ෂණ නිලධාරී 055-2256614<br>2. විෂය භාර නිලධාරී 055-2256614 | දින 02 | 1. ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු. 100.00<br>2. පෙරසැරි ගාස්තුව රු.-1000.00<br>3.පරීක්ෂණ ගාස්තුව- රු 1000.00 |

| අ.අ. | 2<br>ලබාදෙන සේවාව | 3<br>ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | 4<br>සෘජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය | 5<br>වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | 6<br>කාර්ය නිම කිරීමට ගත වන අවම කාලය | 7<br>අදාළ ගාස්තුව |
|---|---|---|---|---|---|---|
| 06 | නොපවරා ගැනීමේ සහතිකය නිකුත් කිරීම | 1. නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය<br>2. ඉඩමට අදාළ මිනින්දෝරු සැලැස්යම් පිටපතක්<br>3. ඉල්ලුම්කරු ඉඩමේ හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩම් හිමිකරුයේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය<br>4.ඉඩමේ ඔප්පුවේ පිටපතක් | 01.පෙරටු කාර්යාල නිලධාරි<br>055-2256614 | 01.ආදායම් පරීක්ෂක<br>055-2256614<br>02.විෂය භාර නිළධාරි<br>055-2256614 | විනාඩි 30 | පෙරසැරි ගාස්තුව<br>රු1000.00 |
| 07 | මාර්ග පළුදු කිරීමට අවසර ඉල්ලීම | 1. නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය<br>2. පළුදු කිරීමට අදහස් කරන මාර්ගයේ නියමිත ස්ථානයට ළඟා විය හැකි පහසු මාර්ගය පෙන්නුම් කරන දළ රූප සටහනක්.<br>3. අදාළ සේවාසම්බන්ධතාව සපයන ආයතනය විසින් නිකුත් කළ ලිපියේ පිටපතක්. | 01.පෙරටු කාර්යාල නිලධාරී<br>055-2256614 | 01.තාක්ෂණ නිලධාරී-<br>055-2256614<br>2. විෂය භාර නිලධාරී -<br>055-2256614 | දින - 01 | 01- මාර්ග උරහිස පළුදු කිරීම- වර්.අඩි 01-රු 150.00 බැගින්<br>02- මාර්ග හරහා පළුදු කිරීම- තාර / කාපට්-වර්.අඩි 01ක්- රු 350.00 බැගින්<br>කොන්ක්‍රීට් - වර්.අඩි 01ක්- රු 300.00 බැගින්<br>බොරළු - වර්.අඩි 01ක්- රු 250.00 බැගින්<br>03-ආපසු ගෙවන ඇප තැම්පතු මුදල- රු 3000.00 |
| 08 | ක්‍රීඩාපිටි කුලියට දීම | 1. නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය | 1.පෙරටු කාර්යාල නිලධාරී<br>055-2256614<br>2. ක්‍රීඩාභූමිය භාර නිලධාරී<br>055-2256614 | තාක්ෂණ නිලධාරී<br>055-2256614 | 1. ක්‍රීඩාපිටිය වෙන් කිරීම විනාඩි 10 | 1. ක්‍රීඩාපිටි ගාස්තුව<br>වෙළඳ ප්‍රවර්ධක කටයුතු සඳහාරු 2000.00<br>අනෙකුත් කටයුතු සඳහා රු1500.00<br>විනෝද කටයුතු සඳහා-රු 1000.00<br>2. ආරක්ෂිත ඇපය රු15000.00 |
| 09 | උත්සව ශාලා/ නගර ශාලා/ ප්‍රජා ශාලාකුලියට දීම | 1. නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය | 1.පෙරටු කාර්යාල නිලධාරී<br>055-2256614<br>2.ශාලාව භාර නිලධාරී<br>055-2256614 | තාක්ෂණ නිලධාරී<br>055-2256614 | 1. ශාලාව වෙන් කිරීම විනාඩි 05 | 1. ශාලාගාස්තුව<br>ආදාළල්පත කාර්යාලයේ ශ්‍රවණාගාරය-රු 5000.00<br>ශ්‍රවණාගාරය ඉදිරිපස ශාලාව-1000.00 |

| අ.අ. | 2<br>ලබාදෙන සේවාව | 3<br>ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | 4<br>සෘජුව සම්බන්ධ වන නිලධාරියාසහ දුරකථන අංකය | 5<br>වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | 6<br>කාර්ය නිම කිරීමට ගත වන අවම කාලය | 7<br>අදාළ ගාස්තුව |
|---|---|---|---|---|---|---|
| 10 | දේපළ හිමිකම ලියාපදිංචි කිරීම හා සංයශෝධනය කිරීම | 1.නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම්පත්‍රය (පිටපත් 2 කින් යුක්ත ව)<br>2.නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ඔප්පුවේ පිටපත් 2 ක්<br>3.ඉඩමේ මිනින්දෝරු සැළැස්මේ පිටපතක් 2ක් | 1.පෙරටු කාර්යාල නිලධාරී 055-2256614 | 01.විෂය භාර නිලධාරී 055-2256614<br>2. ආදායම් පරීක්ෂක 055-2256614 | දින 5 | 1. ඉල්ලුම් පත්‍ර ගාස්තුව නැත<br>2. පෙරසැරි ගාස්තුව නැත |
| | | | | | | |
| 11 | ව්‍යාපාර බද්ද අය කර ගැනීම | සභාව විසින් තමන් වෙත එවනු ලබූ වයපාර බදු නිවේදනය | 1.පෙරටු කාර්යාල නිලධාරී 055-2256614 | ආදායම් පරීක්ෂක- 055-2256614 | විනාඩි 15 | රු1200.00/3000.00 |
| 12 | කර්මාන්ත බද්ද අය කර ගැනීම | සභාව විසින් තමන් වෙත එවනු ලබූ කර්මාන්ත බදු නිවේදනය | 1.පෙරටු කාර්යාල නිලධාරී 055-2256614 | ආදායම් පරීක්ෂක 055-2256614 | විනාඩි 15 | අවම රු 500.00<br>මධ්‍යම -රු 750.00<br>උපරිම -රු 1000.00 |
| 13 | පරිසර ආරක්ෂණ බලපත්‍රය | 1. නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය.<br>2. කර්මාන්තය හෝ ව්‍යාපාරය පිහිටා ඇති ස්ථානයට යන මාර්ගයේ දළ සටහනක්.<br>3. කාර්යයේ යෙදුවන සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර.<br>4. වයපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ, සහතික කළ පිටපතක්. (බලපත්‍රය අලුත් කිරීමක දී අවශ්‍ය නොවේ.)<br>5. ව්‍යාපාරය කරයගන යන ස්ථානයට අයත් ඉඩයම් ඔප්පුයේ පිටපතක්. (බලපත්‍රය අලුත් කිරීමක දී අවශය නොවේ)<br>6. කර්මාන්තය / වයපාරය කරයගන යන තැනැත්තා ඉඩයම් අයිතිය යනාමැති නම්, අයිතිකරු සමග එළඹ ගත් ගිවිසුමක් වේ නම් එය හෝ ඉඩයම් අයිතිකරුයේ කැමැත්ත ප්‍රකාශිත ලිපියේ සහතික කළ පිටපතක්. (බලපත්‍රය අලුත් කිරීමක දී අවශය නොවේ)<br>7. ඉඩමේ අනුමත කළ මිනින්දෝරු සැළැස්මේ සහතික කළ පිටපතක්. (බලපත්‍රය අලුත් කිරීමක දී අවශය යනාවේ)<br>8. අනුමත යගාඩනැගිලි සැළැස්යම් සහතික පිටපතක් (බලපත්‍රය අලුත් කිරීමක දී අවශය නොවේ) | 1.පෙරටු කාර්යාල නිලධාරී 055-2256614 | 1. විෂය භාර නිලධාරී<br>2. තාක්ෂණ නිලධාරී<br>3. තාක්ෂණික කමිටුව 055-2256614 | දින 14 | ඉල්ලුම් පත්‍ර ගාස්තුව නැත.<br>බලපත්‍ර ගාස්තුව-රු 4500.00 |

| 1 | 2<br>ලබාදෙන සේවාව | 3<br>ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | 4<br>සෘජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය | 5<br>වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | 6<br>කාර්ය නිම කිරීමට ගත වන අවම කාලය | 7<br>අදාළ ගාස්තුව |
|---|---|---|---|---|---|---|
| 14 | වාහන හා යන්ත්‍රෝපකරණ කුලියට දීම | නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය | 1.පෙරටු කාර්යාල නිලධාරී<br>055-2256614<br>2.වාහන රියදුරු / යන්ත්‍ර ක්‍රියාකරු<br>055-2256614 | 1.පෙරටු කාර්යාල නිලධාරී-<br>055-2256614<br><br>2.තාක්ෂණික නිලධාරී<br>055-2256614 | වෙන් කිරීම සඳහා දින 1 | වාහනය පැයකට දිනකට ( දිකතට පැය 06<br>රු ශත රු<br>බැකෝ යන්ත්‍රය<br>ඉන්ධන සහිතව 6500 00<br>39000 00<br>ඉන්ධන රහිතව 2600 00<br>15600 00<br>වැඩ නොකර තබාගන්නා දිනකට -<br>- 4500 ශත<br>රෝලර් ( මාර්ග තලනය)<br>ඉන්ධන රහිතව (අවම පැය 04ක් වත් විය යුතුයි) 1500 00<br>9000 00<br>වැඩ නොකර තබාගන්නා දිනකට-<br>- 4500 00<br>වැකර් යන්ත්‍රය<br>4000 00<br>2000 00<br><br>ඉන්ධන සහිතව(අවමය පැය 04ක් වත් විය යුතුයි) 1850 00<br>11100 00<br>ඉන්ධන රහිතව -<br>5500 00<br>රෝඩරිය 7000 00<br><br>වැඩ නොකර තබාගන්නා දිනකට<br>2000 00<br>කොන්ක්‍රීට් මිශ්‍රම<br>ක්‍රියාකරු සමඟ (ඉන්ධන රහිතව)<br>6000 00<br>ඇප තැන්පත් මුදල<br>2500.00<br>වැඩ නොකර තබාගන්නා දිනකට<br>2000 00<br>ටිපර් රථය<br>ඉන්ධන සහිතව රියදුරු සමඟ |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | දිනකට(උපරිමය කි.මී 100ක් සඳහා වන අතර වැඩිවන සෑම කිලෝමීටරයක් සඳහා රු.350.00ක් අය කෙරේ)<br>23500 00<br>ඉන්ධන රහිතව රියදුරු සමග දිනකට 10000 00<br>වැඩ නොකර තබාගන්නා දිනකට<br>4500 00<br>කැබ් කැබ් රථය<br>ඉන්ධන සහිතව රියදුරු සමඟ දිනකට(උපරිමය කි.මී 100ක් සඳහා වන අතර වැඩිවන සෑම කිලෝමීටරයක් සඳහා රු.260.00ක් අය කෙරේ)<br>15000 00<br>ඉන්ධන රහිතව රියදුරු සමග දිනකට 12000 00<br>වැඩ නොකර තබාගන්නා දිනකට<br>4500<br>කොකු නගුල ඉන්ධන සහිතව මීටර් පැයක් සඳහා 5500 00<br><br>ඩිස් නගුල භාවිතය(ඉන්ධන සහිතව මීටර් පැයක් සඳහා)<br>4500 00<br>වල් කපන මැෂිම භාවිතය<br>7000 00 |
| 15 | ජල බවුසර් සේවාව ලබාදීම | නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය | 1. යපරටු කාර්යාල නිලධාරී<br>055-2256614<br>2. ජල බවුසර් රියදුරු<br>055-2256614 | තාක්ෂණ නිලධාරී<br>055-2256614 | බවුසරය යොන් කිරීමට විනාඩි 15 | ට්‍රැක්ටර් ජල බවුසරය<br>ඇන්ජිම සහිතව, ඉන්ධන (ලීටර් 3000) රහිතව (කර්මාන්ත හා වාණිජ කටයුතුවලදී) 7000.00<br>ඇන්ජිම හා ඉන්ධන සහිතව වාණිජ කටයුතුවලදී දිනකට<br>11000.00<br>ඇන්ජිම රහිතව (ලීටර් 3000) වානිජ නොවන කටයුතුවලදී දිනකට<br>1000.00<br>ඇන්ජිම රහිතව (ලීටර් 3000) වානිජ/කර්මාන්ත කටයුතුවලදී දිනකට<br>2000.00<br>ප්‍රවාහනය - පළමු කිලෝමීටරය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | සඳහා රු.1000.00ද වැඩිවන සෑම කි.මී1 කටම රු.350.00 බැගින්(දිනකට නොගන්නා අවස්ථාවේ දී )<br>වැඩ නොකර තබාගන්නා දිනකට 2000.00<br>ලොරි බවුසරය- (ලීටර් 6000 )<br>ඉන්ධන සහිතව රියදුරු සමග- දිනකට 23000.00<br>ඉන්ධන රහිතව රියදුරු සමග- දිනකට 10000.00<br>වැඩ නොකර තබාගන්නා දිනකට 4500.00<br>ප්‍රවාහනය - පළමු කිලෝමීටරය සඳහා රු.1000.00ද වැඩිවන සෑම කි.මී1 කටම රු.350.00 බැගින්(දිනකට නොගන්නා අවස්ථාවේ දී ) |
| 16 | ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශන අවසර පත්‍ර නිකුත් කිරීම | 1. නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය<br>2. A 4 කඩදාසියක මුද්‍රණය කරන ලද, ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දැන්වීමෙහි සමරූපී ආදර්ශයක් (යොදාගනු ලබන වර්ණ ද සහිත);<br>3. කිසියම මාර්ගයක රක්ෂිතයක සවි කර ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් පුවරුවක් වන විට, අදාළ වන පරිදි ඒ මාර්ගයේ අයිතිය ඇති මාර්ග සංවර්ධන අධිකාරිය හෝ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය හෝ පළාත් පාලන ආයතනය විසින් ඒ සඳහා අවසර දුන් ලිපියේ මුල් පිටපත;<br>4. කිසියම් මාර්ගයක රක්ෂිතයක සවි කර ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් පුවරුවක් වන විට, අදාළ ප්‍රචාරක දැන්වීම් පුවරුව ප්‍රදර්ශනය කරන ස්ථානය අයත් වන පොලිස් ස්ථානයේ රථ වාහන අංශයේ ප්‍රධානියා විසින් නිකුත් කළ ලිපියේ මුල් පිටපත.<br>5. ඉල්ලුම්කරු ඉඩමේ අයිතිකරු නොවනවන විට, දැන්වීම ප්‍රදර්ශනය කරනු ලබන ඉඩමේ හෝ ගොඩනැගිල්ලේ අයිතිකරු විසින් ඒ සඳහා ඉඩ දෙන ලද බව ප්‍රකාශිත ලිපියේ මුල් පිටපත. | 1. පෙරටු කාර්යාල නිලධාරී 055-2256614 | 1. විෂය භාර නිලධාරී 055-2256614<br>2. ආදායම් පරීක්ෂක 055-2256614 | දින 03 | ඉල්ලුම් පත්‍ර ගාස්තුව නැත. |
| | 2 | 3 | 4 | 5 | 6 | 7 |

| | ලබාදෙන සේවාව | ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | සෘජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය | වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | කාර්යය නිම කිරීමට ගත වන අවම කාලය | අදාළ ගාස්තුව |
|---|---|---|---|---|---|---|
| 17 | වෙළෙඳ බලපත්‍ර නිකුත් කිරීම | 1. නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය<br>2.පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගත යුතු කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් වන විට වලංගු පරිසර ආරක්ෂණ බලපත්‍රයේ සහතික කළ පිටපත | පෙරටු කාර්යාල නිලධාරී 055-2256614 | 1.මහජන සෞඛ්‍ය පරීක්ෂක 055-2256614<br>3. තාක්ෂණ නිලධාරී 055-2256614<br>4. 3 ආදායම් පරීක්ෂක -055-2256614 | දින 03 | . රු.500.00/750.00/1000.00 |
| 18 | සංවර්ධන බලපත්‍රයක වලංගු කාලය දීර්ඝ කිරීම | 1. නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය<br>2. අනුමත කළ සංවර්ධන සැළැස්මේ මුල් පිටපත<br>3. නිකුත් කළ සංවර්ධන බලපත්‍රයේ පිටපත<br>4. ඉල්ලුම්කරුගේ ජාතික හඳුනුම් පත්‍රයේ සහතික කළ පිටපතක්.<br>5. ඉල්ලුම්කරු ඉඩමේ හිමිකරු නොවන අවස්ථාවක දී ඉඩමේ හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය | පෙරටු කාර්යාල නිලධාරී 055-2256614 | 01.විෂය භාර නිලධාරී 055-225614<br>02.තාක්ෂණ නිලධාරී 055-2256614 | දින 02 | පෙරසැරි ගාස්තුව රු1000.00 |
| 19 | ගස්වලින් සිදු වන අනතුරුදායක තත්ත්වය ඉවත් කිරීම | නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය | පෙරටු කාර්යාල නිලධාරී 055-2256614 | 01.තාක්ෂණ නිලධාරී 055-2256614 | දින 01 | ගාස්තු අය නොකරයි |
| 20 | විනෝද බදු අය කර ගැනීම සහ විනෝද බද්දෙන් නිදහස් කිරීම | 1. වියනෝද බේද අය කර ගැනීයම් කාර්යය සඳහා-<br>i. අලෙවි කිරීම සඳහා සූදානම් කළ මුද්‍රිත ප්‍රවේශ පත්‍ර.<br>ii. අන්තර්ජාලය ඔස්සේ අලෙවි කිරීමට යෝජිත ප්‍රවේශ පත්‍රවල විද්‍යුත් මුද්‍රා තැබීම සඳහා පරිගණක මුර පදය<br>2. විනෝද බද්දෙන් නිදහස් කිරීමකට අදාළ වන විට, ඉහත 1 හි පරිදි ක්‍රියා කරමින්<br>i. අලෙවි කිරීමට යෝජිත ප්‍රවේශ පත්‍රවල වටිනාකම අනුව, පළමුව විනෝද බද්ධට සමාන මුදල සභාවේ තැන්පත් කළ යුතුය.<br>ii. විනෝද බද්ද තැන්පත් කරන අවස්ථාවේ දී ම විනෝද කාර්යයේ ආදායම් හා වියදම් ඇස්තමේන්තුව.<br>iii. විනෝද කාර්යය අවසන් වී දින 30 කට පෙර, විනෝද කාර්යයේ සත්‍ය ආදායම් හා වියදම් විස්තරය | පෙරටු කාර්යාල නිලධාරී 055-2256614 | 01. ආදායම් පරීක්ෂක 055-2256614 | 1. දින 02<br>2. වාර්තාව භාර දුන් දින සිට දින 03 | සභාව අනුමත කල විනෝද බදු ප්‍රතිශතය 10% |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 21 | ප්‍රසිද්ධ රඟ දැක්වීම් හාසණයකළි බලපත්‍ර නිකුත් කිරීම | 1 නිවැරදිව සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රය.<br>2. A 4 ප්‍රමාණයේ කඩදාසියක අඳින ලද සණයකළියේ කාර්යයට යොදාගන්නාසෑම අංගයක් ම පෙන්නුම් කරන සණයකළි භූමියේ දළ රූප සටහනක්.<br>3. ඒ ස්ථානයට රැස් වන මහජනතාවට ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් (ස්ත්‍රී/පුරුෂ සහ ආබාධිත අයට වෙන වෙනම) සපයනු ලබන බවට තහවුරු කරන ලිපියක්;<br>4. ඒ ස්ථානයේ ඉදි කර ඇති තාවකාලික ගොඩනැගිලි ප්‍රමාණවත් සවි ශක්තියකින් යුක්ත වන බවට යාන්ත්‍රික ඉංජිනේරුවරයකු විසින් නිකුත් කළ සහතිකයක්.<br>5. ඒ යම් ගොඩනැගිල්ලක රැස් වන මහජනතාවට දූෂණයට ලක් නොවූ හා ප්‍රමාණවත් වාතාශ්‍රය පවතින බවට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී විසින් නිකුත් කළ සහතිකයක්;<br>6. හදිසි ගිනි ගැනීමක දී යොදාගත හැකි පරිදි ප්‍රමාණවත් ගිනි නිවීම් උපකරණ (සාමාන්‍ය ගිනි නිවීම්, විදුලි ගිනි නිවීම් සහ ඉන්ධන ගිනි නිවීම් උපකරණ) යොදාගනු ලබන බව තහවුරු කරන ලිපියක්.<br>7. ආපදාඅවස්ථාවක දී, රැස් වී සිටින ජනතාව ඉතාකෙටි කාලයක් ඇතුළත ඉන් ඉවත් කිරීමට ප්‍රමාණවත් පිටවීමේ දොරටු සෙහ ආරක්සිත වඩා පිළියවළ යොදාඇති බවට සෞඛය වෛද්‍ය නිලධාරී විසින් නිකුත් කළ සහතිකයක්;<br>8. සණයකළි භූමිය තුළ සාමය පවත්වායගන යාමට අවශය වඩා පිළිවෙල යොදා ඇති බවට ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපති විසින් නිකුත් කරන ලද සහතිකයක් | පෙරටු කාර්යාල නිලධාරී 055-2256614 | 01.විෂය භාර නිලධාරී 055-2256614<br>02.තාක්ෂණ නිලධාරී 055-2256614<br><br>3. මහජන සෞඛ්‍ය පරීක්ෂක 055-2256614 | දින 02 | බලපත්‍ර ගාස්තුව රු . 500.00 |
| 22 | ඇතැම් ඉඩම් විකිණීම මත බදු අය කර ගැනීම | සභාව විසින් තමන් වෙත එවනු ලබූ ඇතැම් ඉඩම් විකිණීම මත බදු නිවේදනය | පෙරටුකාර්යාල නිලධාරී 055-2256614 | 1.තාක්ෂණ නිලධාරී 055-2256614<br>2. ආදායම් පරීක්ෂක 055-2256614 | දින 02 | |

| අ.අ | 2<br>ලබාදෙන සේවාව | 3<br>ඉදිරිපත් කළ යුතු ලියකියවිලි | 4<br>සෘජුව සම්බන්ධ වන නිලධාරියා සහ දුරකථන අංකය | 5<br>වෙනත් නිලධාරීන් සහ දුරකථන අංක | 6<br>කාර්ය නිම කිරීමට ගත වන අවම කාලය | 7<br>අදාළ ගාස්තුව |
|---|---|---|---|---|---|---|
| 23 | සභාව සතු කඩ කාමරවල අයිතිය සහ සති පොළ ගාස්තු අය කිරීමේ අයිතිය වාර්ෂිකව බදු දීම | පහත සඳහන් ලේඛන ඇතුළත් කරමින්මුල් පිටපත හා දෙවන පිටපත වෙන වෙනම කවරවල බහාමුද්‍රාතබන ලද ලංසු ඉල්ලීම. 1. වෙළෙඳ කුටි / කඩ කාමර සඳහාවන විට, ඇමුණුම 02 හි IV කොටසේ ඉල්ලුම් පත්‍රය හෝ සති පොළ සඳහාවන විට, ඇමුණුම 03 හි IV යකොටසේ ඉල්ලුම් පත්‍රය<br>2. ලංසු ආරක්ෂණ ඇප මුදල සභාවේ නාලපත් කළ ලදුපයත් මුල් පිටපත හා සහතික කළ පිටපතක් හෝ එම ඇපය බැංකු අණකරයක් වන විට, එහි මුල් පිටපත හා සහතික කළ පිටපත<br>3. ලංසු ඉල්ලුම්කරුයේ ජාතික හඳුනුම් පත්‍රයේ සහතික කළ පිටපත් දෙකක්<br>4. ලංසු ඉල්ලුම්කරුගේ ලිපිනය තහවුරු කරන ලේඛනයක සහතික කළ පිටපත් දෙකක්<br>5. ලංසු ඉල්ලුම්කරු සංස්ථාගත සමාගමක් වන විට, සංස්ථාගත කිරීමේ සහතිකයේ, සහතික කළ පිටපත් දෙකක්<br>6. ලංසු ඉල්ලුම්කරු ආදායම් බදු ගෙවන්නෙකු නම්, ආදායම් බදු ලියාපදිංචි සහතිකයේ, සහතික කළ පිටපත් දෙකක්. | 1.පෙරටු කාර්යාල නිලධාරී<br>055-2256614<br>2.ලංසු විවෘත කිරීමේ කමිටුනිලධාරීන්<br>055-2256614 | ලේකම්<br>055-2256614 | ලංසු විවෘත කළ දින සිට දින 14 | 1. ලංසු ඉල්ලුම් පත්‍ර ගාස්තුව රු.5000.00<br>2. ලංසු ආරක්ෂණ ඇප මුදල (අවම ලංසු වටිනාකමෙන් 5%)<br>3. ලංසු ප්‍රදානයට පසු, පිළිගත් ලංසු වටිනාකමෙන් -<br>පිළිගත් ටෙන්ඩර් මුදලින් 3/12ක බදු කුලී ආරක්ෂණ ඇපයක් |
| 24 | රජයේ ඉඩම් දීර්ඝ කාලීන ව බදු දීමේ දී ප්‍රාදේශීය ලේකම් වෙත එකඟතාව ලබාදීම | 1. ප්‍රාදේශීය ලේකම් විසින් සභාවේ එකඟතාව ඉල්ලන ලිපිය<br>2. බදු දීමට යෝජිත ඉඩමේ පිඹුරේ හෝ අනුරේඛනයේ පිටපතක් | පෙරටු කාර්යාල නිලධාරී<br>☎ 055-2256614 | | දින 04 | පෙරසැරි ගාස්තුව<br>කුඩා පරිමාණ රු.5000.00<br>මධ්‍යයම පරිමාණ රු.10000.00<br>මහා පරිමාණ රු.20000.00 |
| 25 | අක්කර බදු අය කිරීම | 1. ප්‍රාදේශීය සභාවෙන් නිකුත් කළ සතෝෂ්ක්ෂණ නිවේදනය | පෙරටු කාර්යාල නිලධාරී<br>055-2256614 | | විනාඩි 15 | හෙක්ටයාර් 5 දක්වා රු.50 යි වැඩිවන හෙක්ටයාර් 01 කට රු.10.00 බැගින් |

## අපගේ කැපවීම

- අවංකව
- ප්‍රඥාවන්තව
- ආචාර සම්පන්නව
- අවබෝධයෙන් යුක්තව
- විෂය මූලිකව හා අපක්ෂපාතීව
- විනිවිද භාවයෙන් යුක්තව
- වගවීමෙන්
- අප්‍රමාදව
- කාර්යක්ෂමව හා සඵලතාවයෙන්

ලබාදීමට කැපවී සිටින්නෙමු.

## අපගේ අපේක්ෂාව

අප ආයතනය කෙරෙහි ඔබ තබා ඇති විශ්වාසය ගැන ඔබට ස්තූති කරන අතර, අපගේ සේවය සඳහා ඔබ විසින් කරනු ලබන ඉල්ලීම්, යුක්ති සහගත සාධාරණ සහ නියමිත කලට ඉදිරිපත් කිරීමෙන් ද, අංග සම්පූර්ණ නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමෙන් ද අපගෙන් අපේක්ෂා කළ හැකි සහ අපේක්ෂා කළ නොහැකි දේ පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ලබා තිබීම මගින් ද ඔබට අපට සහයෝගය පළකල හැකි බව දන්වනු කැමැත්තෙමු.

## අපගේ ප්‍රමිතීන්

ඔබගෙන් ලැබෙන සෑම ලිඛිත ඉල්ලීමකටම ක්ෂණික ප්‍රතිචාර අපෙන් ලැබෙනු ඇත. අපේ ප්‍රතිචාරය දින 07 ක් ඇතුලත දී ඔබට ලැබෙනු ඇත.

ඔබේ ඉල්ලීම සමඟ ඉල්ලා ඇති තොරතුරු, ලිඛිත ලියකියවිලි සහ ගාස්තු ඉදිරිපත් කර ඇත්තේ නම්, ඔබ ඉල්ලා ඇති සේවය අප විසින් දැනුම් දී ඇති කාල පරාසය තුළ ඔබට ලබාදීමට අපි බැඳී සිටින්නෙමු.

අවසාන තීරණය ගැනීම ප්‍රමාද විය හැකි හෝ අනිවාර්යයෙන්ම ප්‍රමාද වන අවස්ථාවක දී හෝ ගැටළු සහගත තත්ත්වයක් උද්ගත වූ විටක එයට හේතුව අප විසින් ක්ෂණිකව දන්වනු ලැබේ.

**පැමිණිලි සහ සහන ලබාදීමේ ක්‍රමවේදය**

අප ආයතනයේ කාර්ය මණ්ඩලය විසින් ආචාර සම්පන්නව, අවශ්‍ය උපකාරය හා සේවාවන් ඔබට ලබාදෙනු ලැබේ. ඉහත සඳහන් ප්‍රමිතීන් හා සම්බන්ධ ඔබට ඇති පැමිණිලි පහත සඳහන් නිලධාරීන් වෙත කරුණාකර ලියාපදිංචි කරන්න.

නම :- ආර්.එම්.නදීකාළුන් අබේකෝන්
තනතුර :- සභාලේකම්
පිහිටි ස්ථානය :- රිදීමාලියද්ද, ප්‍රාදේශිය සභාව
දුරකථනය/ෆැක්ස්/ඊ- මේල්:-074-2395545

නම :- ඩබ්ලිව්.එම් ඉන්ද්‍රාවතී
තනතුර :- ප්‍රධාන කළමණාකරන සේවා නිලධාරී
පිහිටි ස්ථානය :- රිදීමාලියද්ද,ප්‍රාදේශිය සභාව
දුරකථනය/ෆැක්ස්/ඊ- මේල් :- 074-1061820

- සියළු පැමිණිලි ලද බව දින 07 ඇතුළත දන්වන අතර අවසාන පිළිතුර 14 ඇතුළත දන්වනු ලැබේ.
- සේවාලාභී මහජන ඔබෙන් ඉදිරිපත් වන යෝජනා අපි සතුටින් භාර ගනිමු.
  අ. අපගේ සේවාවන් ලබන ඔබ හෝ ඔබේ නියෝජිතයින් සමඟ අප අඛණ්ඩව රැස්වීම් පවත්වනු ලැබේ. ඔබ අප සමඟ සම්බන්ධ - වීමට අපේක්ෂා කරන්නේ නම් කරුණාකර 055-2250175 දුරකථන අංකයෙන් අමතන්න.

පුරවැසි ප්‍රඥප්තිය, අප විසින් සපයනු ලබන සේවාවන්ගේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහා ඔබත් අපත් එක්ව දරණ ඒකාබද්ධ ප්‍රයත්නයකි. ලබාදෙන සේවය තවත් වැඩි දියුණු කිරීමට පහත දක්වා ඇති විස්තර (ආයතනයට අදාළ විස්තර සඳහන් කරන්න) ලබාදීමෙන් අපට උපකාරී වන ලෙස අපි ඔබෙන් ඉල්ලා සිටිමු.

**ප්‍රඥප්තිය යටතේ ලබාදෙන සේවාවන් නිරතුරුව සංශෝධනය කිරීමට සහ වැඩි දියුණු කිරීමට අපි බැඳී සිටිමු.!**

සභාලේකම්,

රිදීමාලියද්ද